# SRI LANKA EXPORT DEVELOPMENT BOARD
# ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
# இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சபை
## MINISTRY OF INDUSTRY AND ENTREPRENEURSHIP DEVELOPMENT

# GULFOOD 2027

## ශ්‍රී ලංකා වෙළඳ මණ්ඩපය (Sri Lanka Country Pavilion)

## 15 -19 මාර්තු 2027 - ඩුබායි, එක්සත් අරාබි එමීර් රාජ්‍යය

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් 2027 මාර්තු 15 සිට 19 දක්වා එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ඩුබායි හි ඩුබායි එක්ස්පෝ සිටි හි පැවැත්වීමට නියමිත GULFOOD 2027 ප්‍රදර්ශනයට ශ්‍රී ලංකා වෙළඳ මණ්ඩපයක් සංවිධානය කිරීමට කටයුතු සූදානම් කර ඇත. GULFOOD යනු ලොව විශාලතම ආහාර සහ පාන ප්‍රදර්ශනවලින් එකක් වන අතර, එයට රටවල් 195 කට අධික සංඛ්‍යාවකින් ප්‍රදර්ශකයින් 8,500 කට වැඩි ප්‍රමාණයක් සහ 250,000 කට අධික ගැනුම්කරුවන් ප්‍රමාණයක සහභාගීත්වයක් ඇත.

GULFOOD ප්‍රදර්ශනය ශ්‍රී ලාංකික අපනයනකරුවන්ට මැදපෙරදිග, අප්‍රිකාව සහ දකුණු ආසියානු (MEASA) කලාපයේ පමණක් නොව යුරෝපා සංගමය (EU Region) සහ ඇමරිකාව තුළ ද ඔවුන්ගේ සැකසූ ආහාරපාන නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමට සහ නව වෙළඳපළ ප්‍රවණතා, නව්‍ය නිෂ්පාදන, තරඟකරුවන්ගේ හැසිරීම් සහ එම අංශයේ යෙදෙන නව තාක්ෂණයන් අධ්‍යයනය කිරීමට වේදිකාවක් සපයනු ඇත.

### අයදුම් කළ හැක්කේ කා හටද?

ජාත්‍යන්තර ආහාර ප්‍රමිතීන්ට අනුකූල වන සහ ජාත්‍යන්තර වෙළඳපළ සැපයුම් ධාරිතාවය සහිත, පහත සඳහන් නිෂ්පාදන කාණ්ඩ යටතේ ආහාර සහ පාන වර්ග සැකසුම්කරුවන්/අපනයනකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

- නැවුම්/සැකසූ පලතුරු සහ එළවළු (ශීත කළ, විජලනය කළ, ටින් කළ/ බෝතල් කළ, පළතුරු යුෂ ආදිය)
- පොල් ආශ්‍රිත ආහාර නිෂ්පාදන (වියළි පොල්, පොල් කිරි, ක්‍රීම්, පවුඩර් ආදිය)
- රසකැවිලි සහ බේකරි නිෂ්පාදන, කිරි නිෂ්පාදන, විශේෂිත සහ පහසු ආහාර නිෂ්පාදන
- කුළුබඩු සහ කුළුබඩු මිශ්‍රණ, තැගි ඇසුරුම්, සගන්ධ තෙල් ආදිය.
- තේ (අගය එකතු කළ – රස කළ තේ බෑග්, තෑගි ඇසුරුම් ආදිය)
- ධාන්‍ය වර්ග සහ ධාන්‍ය ආශ්‍රිත නිෂ්පාදන
- පාන වර්ග
- සෞඛ්‍ය සම්පන්න ආහාර නිෂ්පාදන, ඖෂධීය සහ කාබනික ආහාර නිෂ්පාදන
- ආහාර අමුද්‍රව්‍ය සහ ආහාර අතිරේක
- අනෙකුත් අදාළ ආහාර නිෂ්පාදන

### සහභාගීත්ව පිරිවැය

ඉඩකඩ වෙන්කරවා ගැනීම, කුටි ඉදිකිරීම සහ අනෙකුත් සියලුම වියදම් සහභාගී වන සමාගම් විසින් දැරිය යුතුය. ප්‍රතිපාදන මත පදනම්ව, තෝරාගත් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක (SME) සමාගම් සඳහා ඉඩ පහසුකම්/ඉදිකිරීම් සඳහා වන පිරිවැයෙන් කොටසක් සඳහා මූල්‍ය ආධාර සැපයීම පිළිබඳව අපනයන සංවර්ධන මණ්ඩලය සලකා බලනු ඇත.

### අයදුම් කරන ආකාරය සහ තෝරා ගැනීම

අයදුම්පත්, අපනයන සංවර්ධන මණ්ඩලයේ www.srilankabusiness.com වෙබ් අඩවියේ "Announcements" වෙතින් බාගත කළ හැකිය. නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2026 ජූලි 17 වන දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් අධ්‍යක්ෂ – අපනයන කෘෂි අංශය, අපනයන සංවර්ධන මණ්ඩලය වෙත එවිය යුතුය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "Gulfood 2027" යනුවෙන් සඳහන් කළ යුතුය. වැඩසටහන සඳහා සුදුසු සහභාගිවන්නන් තෝරා ගැනීම අපනයන සංවර්ධන මණ්ඩලය විසින් පත් කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබේ.

වැඩි විස්තර සඳහා **මදුරිකා මැණික්පුර මහත්මිය** – සහකාර අධ්‍යක්ෂ, 011-2300732, 070 208 7273, madurika@edb.gov.lk මගින් සම්බන්ධ කරගත හැක

**සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී**
**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය,**
**NDB / EDB කුළුන, අංක 42, නවම් මාවත, කොළඹ 02.**
**වෙබ් අඩවිය : www.srilankabusiness.com**